# ශ්‍රී ලංකාවට අතීතයෙන් මිදීමට අවස්ථාවක් උදා වී ඇත - ටුක්

(13 අගෝස්තු 2025) ජිනීවාහි දී - දශක ගණනාවක් පුරාවට පවතින දඬුවම් නොලැබීමේ සංස්කෘතිය අවසන් කරමින්, සැබෑ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම ඇතුළුව අතීතයේ සිදු වූ බරපතළ මානව හිමිකම් උල්ලංඝන සහ ජාත්‍යන්තර අපරාධ සම්බන්ධයෙන් දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රමාදව පවතින යුක්තිය සහ වගවීම ලබාදීම සඳහා මෙම ඓතිහාසික අවස්ථාව ශ්‍රී ලංකා රජය විසින් කාර්යක්ෂමව භාවිතා කළ යුතු බව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කාර්යාලය අද නිකුත් කළ වාර්තාවේ දැක්වේ.

“අද, ශ්‍රී ලංකාවට පැවති ක්‍රියාපිළිවෙත් වලින් මිදීමට අවස්ථාවක් උදාවී තිබෙනවා, වින්දිතයින්ට යුක්තිය ඉටු කිරීම, නීතියේ ආධිපත්‍යය ප්‍රතිස්ථාපනය කිරීම සහ වෙනස්කොට සැලකීම සහ දේශපාලන බෙදීම් ඉවත් කිරීම ඇතුළු දිගුකාලීන ගැටළු සම්බන්ධයෙන් නව දිශාවක ගමන් කිරීම සඳහා පවතින නායකත්වය ප්‍රතිඥා දී තිබෙනවා. මෙම කැපවීම්, ප්‍රතිඵල බවට පරිවර්තනය කිරීම සඳහා දැන් අපට පුළුල් මාර්ග සිතියමක් අවශ්‍ය වෙනවා," යැයි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් වොල්කර් ටුක් මහතා පැවසීය.

‘‘මෙම ක්‍රියාවලිය ආරම්භ විය යුත්තේ, සිවිල් යුද්ධය අතරතුර රාජ්‍ය සහ ආරක්ෂක හමුදා නිලධාරීන් මෙන්ම, එල්ටීටීඊය වැනි රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් විසින් සිදුකළ මානව හිමිකම් උල්ලංඝනය කිරීම්, අපයෝජන සහ අපරාධවල වගකීම පිළිගැනීමෙනි. එමෙන්ම, මෙම ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් වින්දිතයින් හා ප්‍රජාව වෙත ඇති කළ දිගුකාලීන බලපෑම්වල සත්‍යතාවද පිළිගත යුතුය. ශ්‍රී ලංකා සංචාරයේදී වින්දිතයින්ගේ වේදනාකාරී සහ දුක්ඛිත තත්ත්ව දැනටත් පැහැදිලිව නිරීක්ෂණය කළ හැකි වූ අතර, සත්‍යය හා යුක්තිය අයදිමින් ඔවුන් සිදුකරන ඉල්ලීම්වලට දැඩි අවධානයක් යොමු කිරීම ද අත්‍යවශ්‍යය වේ.’’ යැයි ඔහු කීය.

මෙම වාර්තාව නිකුත් වන්නේ, මහ කොමසාරිස්වරයාගේ ශ්‍රී ලංකා නිල සංචාරය සිදු වී ටික කලකට පසුවය. එම සංචාරය අතරතුර, ඔහු රජය, සිවිල් සමාජ සංවිධාන, වින්දිත කණ්ඩායම්, දේශපාලන පක්ෂ සහ ආගමික නායකයන් සමඟ සාකච්ඡා පැවැත්වූ අතර, ත්‍රිකුණාමලය, යාපනය සහ මහනුවර යන ප්‍රදේශවල ද සංචාරය කළේය. ආරක්ෂක අංශයේ පුළුල් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයක් සහ ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් සහතික කරන ආකාරයේ ව්‍යවස්ථාමය, නීතිමය සහ ආයතනික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ අත්‍යවශ්‍යතාව ද වාර්තාවේ අවධාරණය කර ඇත.

“'ජාතික සමගිය' පිළිබඳ දැක්ම සාක්ෂාත් කර ගැනීමටත්, විශේෂයෙන් අතීතයේ සිදුවූ මානව හිමිකම් උල්ලංඝනයවීම් නැවත සිදු නොවන බව සහතික කිරීම සඳහාත්, රජය මෙම පියවර අනුගමනය කිරීම ඉතා වැදගත් වේ,” යනුවෙන් ටුක් මහතා පවසයි. වගවීම, සංහිඳියාව සහ මානව හිමිකම් ආරක්ෂා කරමින් ඒවා පවත්වා ගෙන යාම සඳහා ශ්‍රී ලංකාවට සහාය දැක්වීමට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කාර්යාලයේ අඛණ්ඩ කැපවීම පිළිබඳව ඔහු තවදුරටත් අවධාරණය කළේය.

ස්වාධීන අභිචෝදක කාර්යාලයක් පිහිටුවීමට රජය ගෙන ඇති පියවර සාදරයෙන් පිළිගන්නා බවත්, බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය බරපතල ලෙස උල්ලංඝනය කිරීම පිළිබඳ නඩු විභාග කිරීම සඳහා විශේෂ ස්වාධීන නීතිඥයවරයෙකු ඇතුළු ඊට කැපවූ අධිකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම මෙම වාර්තාව තුළින් අගය කොට සලකා ඇත. තවද, උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල හමුදාව විසින් අත්පත් කරගෙන සිටින ඉඩම් නිදහස් කිරීම, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) අවලංගු කිරීම සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ දිගු කාලීන ව රඳවාගෙන සිටින සිරකරුවන් නිදහස් කිරීම - ඔවුන්ගෙන් ඇතැමුන් දැන් දශක ගණනාවක් තිස්සේ සිරගතව සිටින අතර ඒ සම්බන්ධයෙන් ද මෙම වාර්තාව අවධානය යොමුකර ඇත.

එමෙන්ම, ශ්‍රී ලංකාව තුළ සහ ජාත්‍යන්තරව වගවීම අර්ථවත් කිරීමටත්, සංහිඳියා ප්‍රයත්නයන් සඳහා දායක වන ලෙසත් ජාත්‍යන්තර ප්‍රජාවගෙන් මෙම වාර්තාව තවදුරටත් ඉල්ලා සිටී. “ජාත්‍යන්තර නීතිය යටතේ, සිදුවූ අපරාධ විමර්ශනය කිරීම, නඩු පැවරීම සහ වගවීම සහතික කිරීම සඳහා මූලික වගකීම ශ්‍රී ලංකා රජය සතු වුවද, ජාත්‍යන්තර ක්‍රම මගින් මෙය සම්පූර්ණ කර ඒ සඳහා සහාය දැක්විය හැක,” යනුවෙන් ද වාර්තාව සඳහන් කරයි. විශේෂයෙන්ම, වගවීම සම්බන්ධ කටයුතු ඉදිරියට ගෙන යාමටත්, සංහිඳියා ප්‍රයත්නයන් සඳහා දායකවන ලෙසත්, එමෙන්ම එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කාර්යාලයේ ශක්තිමත් හැකියාව ඒ සඳහා උපයෝගී කර ගන්නා ලෙසත්, එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල්වලින් ඔහු ඉල්ලා සිටී.

රජය, අනුස්මරණය සහ සාකච්ඡාව සඳහා වන අවකාශයක් විවෘත කර තිබුණද, විශේෂයෙන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්, ඉඩම් අරවුල් සහ පාරිසරික ගැටළු පිළිබඳ වගවීම සඳහා කටයුතු කරන සිවිල් සමාජ සංවිධාන ක්‍රියාකාරීන් ඉලක්ක කරගනිමින් බියගැන්වීම් සහ හිරිහැර කිරීම් අඛණ්ඩව සිදුවන බවත්, සහ අතුරුදහන් වූ පුද්ගලයින්ගේ පවුල් බිය ගැන්වීම සහ ඔවුන් නිරීක්ෂණය කිරීම සම්බන්ධයෙන් ද මෙම වාර්තාව විස්තර කර තිබේ.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කිරීමට කැපවී සිටියද, නව රජය ද පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමට සහ රඳවා තබා ගැනීමට එම නීතිය භාවිතා කිරීම අඛණ්ඩව සිදු කරගෙන යන බවත් වාර්තාව පෙන්වා දෙයි. අඛණ්ඩව සිදුවන අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම්, වධහිංසා පැමිණවීම් සහ අත්අඩංගුවේ පසුවන විටදී සිදුවන මරණ පිළිබඳ ද මෙහි දී විස්තර කෙරෙන අතර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාවිතය සඳහා හැකි වහාම තහනමක් පනවන ලෙස ද රජයෙන් ඉල්ලා සිටී.

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ **පනත** (OSA), ICCPR පනත, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ පනත් කෙටුම්පත සහ **අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ** පනත ඇතුළුව අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, සංගමය සහ සාමකාමී රැස්වීම වැනි මූලික

අයිතිවාසිකම් සීමා කරන අනෙකුත් නීති හෝ යෝජිත නීති සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම සඳහා ද මෙම **වාර්තාවෙන් ඉල්ලීමක් සිදුකර ඇත.**

වතුකරයේ මලයහ දෙමළ ප්‍රජාව ඇතුළු සියලු ශ්‍රී ලාංකිකයින්ට, විශේෂයෙන් දරිද්‍රතාවයෙන් දරුණු ලෙස පීඩාවට පත්වූවන් සහ වෙනත් අවදානම් සහිත තත්වයන් යටතේ සිටින පුද්ගලයන්ට, ආර්ථික අර්බුදයේ සහ වත්මන් ණය බරෙහි බරපතල බලපෑම් පිළිබඳව ද මෙම වාර්තාව විශ්ලේෂණය කර ඇත.

ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය මූල්‍ය අවකාශය රජයට ලබා දෙන ලෙසත්, ජනජීවිතයට අහිතකර ලෙස බලපාන රාජ්‍ය වියදම් කපාහැරීම් හා අධික ලෙස බදු වැඩි කිරීම වැනි ක්‍රියා තුලින් රටේ මානව හිමිකම් බැඳීම් ඉටු කිරීම සහ ඒවා ක්‍රියාත්මක කරවීමේ හැකියාව අඩාල කිරීමට කටයුතු නොකරන ලෙසත්, ඒ සඳහා අවැසි සහය ලබා දෙන ලෙසත්, මහ කොමසාරිස්වරයා ජාත්‍යන්තර මූල්‍ය ආයතන සහ බාහිර ණය හිමියන්ගෙන් ඉල්ලා සිටියි.

සමාප්තිය.